මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය
~~115~~
28 JUL 2015
ජනාධිපති කාර්යාලය

# ශ්‍රී ලංකා ජනාධිපති
## இலங்கையின் சனாதிபதி
## PRESIDENT OF SRI LANKA

අංකය : එස්පී/ඩීපී | සන්දේශ අංක : පීඑස්/සීපී/17/2015

## අමාත්‍ය මණ්ඩල සන්දේශය

### ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී වැඩපිළිවෙළ එළිදැක්වීම

සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ සෞඛ්‍ය හා යහපැවැත්ම වැඩිදියුණු කරගැනීමේ වැදගත් අංශයක් වශයෙන් මද්‍යසාර, දුම්කොළ හා නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය ක්‍රමානුකූලව අඩු කිරීම හා ඒවා භාවිතයෙන් වන හානි අවම කිරීම සඳහා ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. එය වඩාත් සවිබලගැන්වීමේ අරමුණින් 'ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී වැඩපිළිවෙළ' එළිදැක්වීමත්, එම වැඩපිළිවෙළ පිළිබඳව මහජනයා අතර වැඩි අවධානයක් ඇති කිරීම සඳහාත් 2015 ජූලි මස 09 වන දින සිට අගෝස්තු මස 08 වන දින දක්වා කාලය 'ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ මාසය' ලෙස ප්‍රකාශයට පත්කිරීමට කටයුතු යොදා තිබේ.

ඇමුණුම 01 හි විස්තර කෙරෙන මෙම ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී වැඩපිළිවෙළ පහත දැක්වෙන පරිදි ප්‍රධාන අංශ තුනක් යටතේ ක්‍රියාත්මක වනු ඇත;

1) ප්‍රතිපත්ති හා නීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
2) ප්‍රතිකාර හා පුනරුත්ථාපනය
3) නිවාරණය

වැඩපිළිවෙළ හා වඩාත් සම්බන්ධ විය යුතු එක් එක් අමාත්‍යාංශ විසින් කළ යුතු කාර්යයන් ද ඇමුණුමෙහි දක්වා ඇත.

මෙම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය නායකත්වය ලබාදීමට මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව 'ජනාධිපති කාර්ය සාධක බලකායක්' මා යටතේ දැනටමත් පිහිටුවා ඇති අතර, විවිධ ආගමික නායකයන් හා සමාජ ක්‍රියාකාරීන් ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල දායකත්වයෙන් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කෙරේ.

ඒ අනුව,

අ) ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන යටතේ, ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී වැඩපිළිවෙළ එළිදැක්වීම සඳහාත්,

ආ) සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අර්ධ රාජ්‍ය ආයතන මගින් ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන ක්‍රියාත්මක කරවීම සඳහාත්

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කරමි.

මෛත්‍රීපාල සිරිසේන

015 ජූලි මස 07 වන දින